www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ග්‍රීසියේ ට්‍රක් රථ රියදුරන්ට එරෙහි හමුදා මෙහෙයුම: යුරෝපීය කම්කරුවන්ට අනතුරු ඇඟවීමක්

## Army operation against Greek truck drivers: A warning to European workers

**2010 අගෝස්තු 4**

වැඩවර්ජනයේ නියුතු ග්‍රීක ට්‍රක් රථ රියැදුරන්ට එරෙහිව බලයෙන් හමුදාවට බඳවාගැනීමේ නීති හා හමුදාව යෙදවීම, ග්‍රීක හා යුරෝපීය කම්කරු පන්තියට එරෙහි ප්‍රහාරයන්ගේ නව අවධියක් සටහන් කරයි.

යුරෝපීය සංගමය හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකඟ වූ කප්පාදු පියවරයන්ට එරෙහි ප්‍රතිරෝධය ජය ගැනීම සඳහා අගමැති ජියෝර්ජස් පැපැන්ද්‍රියෝගේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩුව මේ දක්වා බොහෝ කොටම යැපුනේ වෘත්තීය සමිති මතය. වෘත්තීය සමිති, ආන්ඩුව ඉදිරියට ගෙන යමින් තිබෙන මෙහෙයුමට ප්‍රතිපත්තිමය ලෙස සහයෝගය දෙන අතරවාරයේ එක්දින වැඩවර්ජන හා විරෝධතා මාලාවක් කැඳවනු ලැබූහ.

යුරෝපීය මූල්‍ය ප්‍රභූ පැලැන්තිය පැත්තෙන් ගත් විට ප්‍රතිපලය සැලකිය යුතු එකකි. යුරෝපයේ විදේශ පිලිවෙත සඳහා වන හෙලනික් පදනමේ (ඊඑල්අයිඒඑම්ඊපී) තක්සේරුවකට අනුව කප්පාදු වැඩ සටහන ක්‍රියාත්මක කරන ලද 2010 පලමු මාස හතරේදී සියයට 20-30 ත් අතර ප්‍රමානයකින් මූර්ත වැටුප් අඩු කිරීමට ග්‍රීක ආන්ඩුවට හැකි වී තිබේ. වැටුප් කප්පාදුව, වැට් බදු වැඩි කිරීම හා උද්ධමනය වැඩි කිරීමෙන් මෙය සපුරාගෙන තිබේ.

"අගමැති ජියෝර්ජස් පැපැන්ද්‍රියෝ ආන්ඩුව, යුරෝ-කලාපයේ සාමාජික රටක් අය-වැය හිඟය මෙතරම් කෙටි කාලයකින් මෙතරම් විශාල ලෙස අඩු කිරීම සඳහා මෙතෙක් භාර නොගත් කර්තව්‍යයක් ඉටුකිරීමට කැපවී සිටියි" යනුවෙන් (ඊඑල්අයිඒඑම්ඊපී) පදනමේ විශ්ලේෂකයෙකු වන ජෙන්ස් බැස්ටියන් සුඩෙට්ෂ් සේටුං පුවත් පතට ලිවීය. "අභියෝගය කෙටි දුර ධාවනයක් ආරම්භ කරන ආකාරයට මැරතන් ධාවනයක් ඇරඹීම වැනි දෙයකි. පසුගිය විසි අවුරුද්ද තුල වැටුප් මට්ටම්වල මෙවැනි කප්පාදුවක් ග්‍රීක සමාජය කිසිදා අත් දැක නොමැත."

ට්‍රක් රථ රියදුරන්ගේ වැඩවර්ජනය ආන්ඩුවේ කප්පාදු පියවරයන්ට බරපතල තර්ජනයක් එල්ල කලේ ය. පැය 24 ක වැඩවර්ජන කැඳවා ආර්ථිකයට කිසිදු බරපතල හානියක් සිදු නොකරම සාමාජිකයින් ආපසු වැඩට පිටත් කරන වෘත්තීය සමිති ඇති සිවිල් සේවයේ හා කාර්මික අංශයේදී මෙන් නොව 33,000 පමන ට්‍රක් රථ රියදුරන්ගේ දින හයක වර්ජනය ආර්ථිකයේ වැදගත් අංශ වසාදැමී ය.

විශේෂයෙන්ම රටේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වන සංචාරක කර්මාන්තය පිබිදෙන කාලයේ දී පිරවුම්හල්වල ගෑස් හා ඉන්ධන හිඟය අඛන්ඩව දක්නට ලැබුනි. එසේ ම අනෙකුත් කර්මාන්තයන් ද ප්‍රවාහනය බිඳ වැටීමෙන් දුබල විය.

වර්ජනයේ තුන්වන දිනයේ දී ආන්ඩුව, විකල්පය ලෙස කලාතුරකින් භාවිතයට ගෙන තිබෙන නීතියක් සොයා ගත්තේ ය. ඒ යටතේ වර්ජකයන් වහාම ක්‍රියාත්මක වන පරිදි බලහත්කාරයෙන් හමුදාවට අනුයුක්ත කල අතර ඔවුන් නැවත වැඩ ආරම්භ නොකරන්නේ නම් දරුනු දඬුවම්වලට මුහුන දීමට සූදානම්වන ලෙස නියෝගයක් පැනවී ය. ට්‍රක් රථ රියදුරන් මෙම පියවරයන්ට විරෝධය පාමින් වර්ජනය දිගටම ගෙන යෑමට උත්සහා ගත් අතර, ආන්ඩුව වර්ජනය බිඳීමට හමුදාව යොදවා ගුවන් තොටුපල, බලශක්ති බලාගාර සහ අනෙකුත් කටයුතු සඳහා ඉන්ධන සැපයීය.

හමුදාව යෙදවීමේ ක්ෂනික බලපෑම එල්ල වූයේ නොනැමී විරෝධතාවයේ නියුතු වර්ජිකයින්ට නොව, ආන්ඩුව හා සම්මුතියක් ගසා ගැනීමේ උත්සාහයක නිරතව සිටි හා දැන් පරිපූර්නව දනගැසූ පීඑස්එක්ස්ඊඑම් (PSXEM) ප්‍රවාහන වෘත්තීය සමිතියට ය.

1967 සිට 1974 දක්වා ම්ලේච්ච හමුදා ඒකාධිපති පාලනයේ මතකයන් තවමත් ග්‍රීසිය තුල නැවුම් අත්දැකීමක් නිසා හමුදාව යොදා ගැනීම විශේෂයෙන්ම අර්ථභාරීය. 1967 අප්‍රේල් 21 දා ධනපති දේශපාලන නායකයෙකු වූ - වර්තමාන අගමැතිගේ සීයා වූ - ජෝර්ජ් පැපැන්ද්‍රියෝගේ මැතිවරන ජයග්‍රහනය

වැලැක්වීම සඳහා ග්‍රීක හමුදා නායකයින් විසින් කුමන්ත්‍රනයක් දියත් කලේ ය. දහස් ගනනක් දේශපාලන විරුද්ධවාදීන් සිරගත කරනු ලැබීමටත් වධ බන්ධන වලට හා ඝාතනයටත් ලක් විය. නිවාස අඩස්සියේ සිටිය දී ජෝර්ජ් පැපැන්ද්‍රියෝමත් 1968 දී මිය ගියේ ය.

ඒකාධිපතිත්වය බිඳවැටීමෙන් පසුව සමහර කර්නල්වරුන්ට එරෙහිව චෝදනා ගොනුකර සිරගත කරන ලදී. පැපැන්ද්‍රියෝගේ මුනුපුරා වර්ජනයක් බිඳීමට දැන් හමුදාව යොදා ගැනීමෙන් මිලිටරිය තේරුම් ගන්නවා ඇත්තේ, සමාජය තුල "නීතිය" පවත්වා ගැනීම සඳහා යලිත් හමුදාව අවශ්‍ය බව සංඥා කෙරෙන්නේ ය යන්න පමනි.

ට්‍රක් රථ රියදුරන්ගේ වර්ජනය බිඳීමට හා හමුදාව බලමුලු ගැන්වීමට පැපැන්ද්‍රියෝ ගත් තීන්දුවට ග්‍රීසියේ පමනක් නොව මුලු යුරෝපයේම පාලන තන්ත්‍ර සතුටුදායක ලෙස ප්‍රතිචාර දැක්වූහ, එයට ඊනියා වාම ධනේශ්වර පක්ෂ හා වෘත්තීය සමිතිවලින් පවා කිසිදු විරුද්ධත්වයක් පලවූයේ නැත.

ග්‍රීසිය තුලදී සුලු ධනේශ්වර "වාම" කඳවුර ඇතුලත ද එකගත්වය ප්‍රකාශ විය. වාම රැඩිකලුන්ගේ (සිරිසා) හවුලේ පාර්ලිමේන්තු නියෝජිත ඩිමිත්‍රි පපාඩිමෝලිස් ට්‍රක්රථ රියැදුරන්ට පහර දෙමින් ඔවුන්ගේ වැඩ වර්ජනය "වෙලඳපොලේ ගෙල සිරකිරීමටත් ඉන්ධන පිරවුම්හල් වල පෝලිම් ඇති කිරීමටත් හේතුවූ අතර කිසිදු මහජන සහයෝගයක් දිනාගැනීමට අසමත් විය" යනුවෙන් පැවසීය.

සිරිසාවෙන් කැඩීගිය දක්ෂිනාංශික කන්ඩායමක නායකයා වන ෆෝටිස් කවුවෙලිස් ආන්ඩුවේ ඉල්ලීම් වල පදනමේ සාකච්ඡා ගෙනයාමට හැකිවන පරිදි "දරදඬු කාර්මික තන්ත්‍රය අහෝසි කරමින් යලි සාකච්ඡා ඇරඹීම සඳහා වාතාවරනය සකස්කල යුතු බව" කියා සිටියේය.

සිරිසාහි අනෙකුත් නියෝජිතයන් හා ග්‍රීක කොමියුනිස්ට් පක්ෂය (කේකේඊ) ආන්ඩුවේ මර්දන පිලිවෙත් වාචිකව හෙලා දුටු නමුත් ප්‍රධාන වෘත්තීය සමිති විසින් ද අතහැර දමන ලද ට්‍රක් රථ රියදුරන් හට සහයෝගය පල කිරීමට ඇඟිල්ලක් පවා එසවූයේ නැත.

ට්‍රක් රථ රියදුරෝ ඔවුන්ගේ පැවැත්ම සඳහා සටනක යෙදී සිටිති. බොහෝ දෙනෙක් ස්වයං රැකියාවක් ලෙස එහි නිරතවන අතර යුරෝ 300,000 වඩා වැඩි මුදලක් අවශ්‍ය බලපත්‍ර ලබාගැනීම සඳහා සිය ජීවිත කාලීන ඉතිරි කිරීම් සියල්ල එයට ආයෝජනය කර ඇත. ඔවුන්ගේ විශ්‍රාම වැටුප් සඳහා පදනම වන්නේ බලපත්‍ර නැවත විකුනා දැමීම ය. ආන්ඩුව ඉල්ලා සිටින පරිදි බලපත්‍ර ක්‍රමය අහෝසි කර දැමීම මගින් ග්‍රීක ප්‍රවාහන පද්ධතිය යුරෝපීය මහා ප්‍රවාහන සමාගම්වලට විවෘත වනවා පමනක් නොව ග්‍රීක ට්‍රක් රථ රියදුරන්ගේ ජීවනෝපායන් විනාශ කර දමන හා එක් පැන් පහරකින් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අහෝසි කරන ප්‍රහාරයක් ද වන්නේ ය.

ග්‍රීසියට දුන් යුරෝ බිලියන 110 ක ආධාර පැකේජයට හිලව් වශයෙන් යුරෝපා සංගමය හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉල්ලා සිටින ප්‍රධාන කොන්දේසියක් වන්නේ ට්‍රක්රථ හා ටැක්සි රියදුරන්, නීතිඥයින්, ඖෂධවේදීන්, ගෘහ නිර්මාන ශිල්පීන්, ගනකාධිකාරීවරුන් වැනි අනෙකුත් රැකියාවන් සඳහා පවතින සීමාවන් ඉවත් කිරීමයි. මේ ආකාරයට මූල්‍ය අර්බූදයේ හා බැංකුවලට ඇප දීමේ වියදම් දුප්පතුන්, කම්කරු පන්තිය හා විවිධ ක්ෂේත්‍රවල ස්වයං රැකියාවල නියුතු අය මත පටවා තිබේ.

ග්‍රීසියේදී මිලිටරිය යොදා ගැනීම ගැඹුරු අර්ථභාරයක් දරන්නේ මෙම තත්වය තුලය. යුරෝපය පුරාම සූදානම් කෙරෙමින් තිබෙන කප්පාදු වැඩසටහන් අත්හදාබලන තැනක් බවට එරට පත්ව තිබේ. මෙම පිලිවෙත් කෙතරම් පුලුල් හා දරුනු ද යත් ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයකට ඒවා ක්‍රියාවට නැගිය නොහැකිය.

කාලයක් මධ්‍යම පන්තියේ කොටස් ලෙස සැලකුනු ස්ථරයන් ද ඇතුලත් සමාජයේ මේසා විශාල කොටස් එයට ඇතුලත් වීම නිසා සම්ප්‍රදායික කොන්සර්වේටිව් පක්ෂ බොහොමයක් අර්බූදයට පත්ව තිබේ. ජර්මනියේ දී, ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී සංගමය (සීඩීයූ), ක්‍රිස්තියානි සමාජ සංගමය (සීඑස්යූ) හා නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයෙන් (එෆ්ඩීපී) සමන්විත චාන්සලර් මර්කෙල්ගේ හවුල් ආන්ඩුව අභ්‍යන්තර ගැටුම්වලින් පක්ෂාඝාතව තිබේ. ඉතාලියේ දී, බර්ලුස්කෝනිගේ ආන්ඩු පක්ෂය (පීපල් ඔෆ් ෆ්‍රීඩම්) කැබලිවී ගොසින්ය. ප්‍රන්සයේ දී, සාර්කෝසිගේ මහජන ව්‍යාපාරයේ සංගමය (යූඑම්පී) ජනප්‍රියත්වයෙන් පහත වැටී තිබේ. බොහොමයක් රටවල පාලක පන්තීන් හට සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් හා ඔවුන්ගේ පරිවාරක මධ්‍යම පන්තික "වම්මුන්" වෙත වාරු වෙමින් කම්කරු පන්තියට එරෙහිව ප්‍රහාර එල්ල කිරීමට බල කෙරී තිබෙන්නේ මේ හේතුව නිසාවෙනි.

ග්‍රීසියේ හිටපු කැරමැන්ලිස්ගේ කොන්සර්වේටිව් ආන්ඩුව වෙනුවට පැපැන්ද්‍රියෝගේ පැසොක් ආන්ඩුව ආදේශ කිරීම, වත්මන් කප්පාදු වැඩපිලිවෙල ක්‍රියාත්මක කිරීමේ පූර්ව කොන්දේසිය වූයේ ය. ජර්මනියේ දී සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (එස්පීඩී) හා හරිතයන් දිරිමත් කිරීමේ දැනුවත් ප්‍රයත්නයක් ක්‍රියාත්මකව තිබේ. මෙම පක්ෂ දෙක හවුල්ව සිටි චාන්සලර් ගෙර්හාඩ් ෂ්‍රඩර්ගේ ආන්ඩුවෙහි 2010 ''සුභසාධන ප්‍රතිසංස්කරන" න්‍යායපත්‍රය, කම්කරු පන්තියේ පුලුල් ස්ථරයන් දිලිඳුභාවයට ඇද හෙලීමේදී

ඇන්ජෙලා මර්කෙල්ගේ (සීඩීයූ) කොන්සර්වේටිව් ආන්ඩුව පරයා ගියේය.

එහෙත් එවැනි සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩු තාවකාලික විසඳුමක් වනවා පමනි. ඔවුන් විශාල වශයෙන් සිය ඡන්ද ජයග්‍රහන ලබා ගත්තේ කොන්සර්වේටිව් පක්ෂවල කඩා වැටීම, ධනේශ්වර මාධ්‍ය ප්‍රචාර හා සුලු ධනේශ්වර ව්‍යාජ වම්මුන්ගේ සහයෝගයෙනි. කම්කරු පන්තිය අතර සමාජ පදනම ඔවුන්ට නැති වී ඇති අතර බොහෝකොටම වාරූ වී සිටින්නේ වෘත්තීය සමිති නිලධාරී තන්ත්‍රයන් හා ඔවුන්ගේ ම පක්ෂ නිලධාරී තන්ත්‍රයන් මතයි. බලයේ සිටින විට කොන්සර්වේටිව් පක්ෂ මෙන්ම ඔවුන් ද දේශපාලන බාදනයට මුහුන දී සිටී.

එමනිසා, ආඥාදායකත්වයේ රූපාකාරයන් සහිත නව පාලනයන් සෙවීමේ ප්‍රයත්න දරනු ලැබේ. මෙම සූදානම එක් ආකාරයකින් හෝ තවත් ආකාරයකින් සෑම යුරෝපීය රටක් තුලම දැක ගත හැකිය.

හංගේරියාවේ දී දක්ෂිනාංශික ජාතිකවාදී ෆිඩෙස් හා එකළුල්ලේම ෆැසිස්ට්වාදී ජොබික් සංවිධාන සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ කඩා වැටීමේ වාසිය ගසා කමින් වර්ගවාදය ඇවිස්සීමේ ද අසල්වැසි රටවල් සමග ආතතීන් උත්සන්න කිරීමේ හා ආඥාදායක පාලන රූප වර්ධනය කිරීමේ උත්සාහයක නිරතව සිටිති.

නෙදර්ලන්තයේ දී, ගීට් විල්ඩර්ස්ගේ වර්ගවාදී නිදහස් පක්ෂය ආන්ඩුවට බහුතරය සම්පාදනය කර තිබෙන අතර සභාගයට නිල වශයෙන් ඒකාබද්ධ වීමට නියමිතව සිටියි.

ප්‍රන්සයේ දී රෝම හා මුස්ලිම්වරුන්ට එරෙහි ප්‍රකෝපකාරී නීතිමය අරම්භකත්වයන් මගින් ආන්ඩුව, ෂොන්-මරී ල පෙං ගේ ජාතික පෙරමුනේ අනුගාමිකයන් ඒකාබද්ධ කර ගැනීමට මාන බලයි.

මිලිටරියට පැවරෙන වැඩිවන සමාජ කාර්ය භාරය ද පොදු ප්‍රපංචයකි. බලහත්කාරයෙන් බඳවාගත් හමුදාවන්, ඇෆ්ගනිස්ථානයේ සටන් තුලින් හා අනෙකුත් විදේශ දූත මෙහෙවර වලින් රුදුරු ලෙස පන්නර ගන්වා ඇති වෘත්තිය හමුදාවන් මගින් විස්ථාපනය කෙරේ. "ත්‍රස්තවාදයට එරෙහි සටන" යන කඩතුරාව යටතේ තම රට තුල මිලිටරිය යොදා ගැනීම විවෘතවම සාකච්ඡාවට බඳුන්ව තිබේ. ජර්මනිය තුල වසර 60ක් තිස්සේ තහනමට ලක්ව තිබෙන එවැනි මිලිටරි මෙහෙයුම් දැන් අනුමත කල යුතු ද යන්න පිලිබඳව ශ්‍රේෂ්ඨාධිකරන මන්ඩප දෙකක් තුල වාද විවාද සිදුවෙයි.

මෙම සන්දර්භය තුල, ග්‍රීසියේ ට්‍රක් රථ රියදුරන්ගේ වර්ජනයට එරෙහිව මිලිටරිය යොදා ගැනීම සමස්ත යුරෝපීය කම්කරු පන්තියටම අනතුරු ඇඟවීමක් වෙයි. දැනටමත් එකගවී ඇති හෝ සූදානම් කෙරෙමින් තිබෙන හෝ කප්පාදු පියවරයන්ගේ පරිමාව නො වැලැක්විය හැකි සමාජ ගැටුම් නිර්මානය කරනවා ඇත. සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්, වෘත්තීය සමිති හා ඔවුන්ගේ සුලු ධනේශ්වර "වමේ" ආධාරකරුවන් මෙම ප්‍රහාර ක්‍රියාවේ යෙදවීම සඳහා ප්‍රමුඛ ක්‍රියා කලාපයක් ඉටු කරයි. කම්කරු පන්තිය මැඩපැවැත්වීමෙන් හා පක්ෂාඝාත කිරීම මගින් ඔවුහු පාලන තන්ත්‍රයන්ට තවත් දක්ෂිනාංශික හා ආඥාදායක ස්වරූපයේ පාලන රූපයන් සූදානම් කර ගැනීමට අවශ්‍ය කාලය ලබා දෙති.

දේශපාලන ක්‍රියාවලීන් තුල වැඩකරන ජනතාවගේ ස්වාධීන මැදිහත් වීම මත දැන් සියල්ල රඳා පවතී. සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ හා වෘත්තීය සමිතිවල අධිකාරයෙන් ඔවුන් බිඳී වෙන් විය යුතු අතර, මූල්‍ය කතිපයාධිකාරයේ ඉල්ලීම්වලට එරෙහිව කොන්දේසි විරහිතව තමන්ගේ අවශ්‍යතා ආරක්ෂා කරන්නා වූ තමන්ගේ ම පක්ෂය ඔවුන් ගොඩනගාගත යුතුය.

එවන් පක්ෂයක පදනම විය යුත්තේ. බහුතර ජනතාවගේ සමාජ අවශ්‍යතා බැංකුවල හා සමාගම්වල ලාභ උත්සුකයන්ට ඉහලින් තබන ජාත්‍යන්තර සමාජවාදී වැඩපිලිවෙලකි. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ලෝකය පුරා එවැනි පක්ෂ ගොඩනගමින් සිටී.

**පීටර් ෂ්වාර්ට්ස්**

© www.wsws.org